**2025 වර්ෂයට සැපයුම්කරුවන් /කොන්ත්‍රාත්කරුවන්**
**ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා පොදු උපදෙස්, නියමයන් හා කොන්දේසි**
**ආරක්ෂක අමාත්‍යාංශය**

1. 2025 වර්ෂය සඳහා සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවිය මගින් 2024.10.07 දින සිට 2024.11.08 දින දක්වා අය කිරීමකින් තොරව බාගතකරගැනීමට (Download) හැකිවේ.

2. සැමවිටම නිවැරදි තොරතුරු පමණක් සපයන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. සපයා ඇති කවර හෝ තොරතුරක් නිවරදි නොවන බවට හෝ කවර හෝ වැදගත් තොරතුරක් ලබාදීමෙන් වැලකී සිටින බවට පෙනී යන්නේ නම් එවැනි අයදුම්කරුවෙකු ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් නොලබනු ඇත. අසම්පූර්ණ හෝ අපැහැදිලි අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අයදුම්පත සමග අමුණා එවිය යුතු ලිපි ලේඛන පහත සඳහන් වේ.**

3. අයදුම්පතට ඇමිණිය යුතු සියලු ලිපි ලේඛන අනුක්‍රමිකව අංකනය කළ යුතුය. මුළු පිටු සංඛ්‍යාව ප්‍රධාන අයදුම්පතෙහි දකුණු පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

**3.1 දේශීය සැපයුම්කරුවන්**

අ. නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, සමාගම් ලේකම්වරයෙකු හෝ සාමදාන විනිශ්චකාරවරයෙකු විසින් සත්‍ය බවට සහතික කරන ලද ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්. (එම ආයතන 2023.12.31 දින හෝ ඊට පෙර ලියාපදිංචි කරන ලද ආයතන විය යුතු අතර එදිනට පසුව ලියාපදිංචි කල ආයතන 2025 වර්ෂයට ලියාපදිංචි වීමට සුදුසුකම් නොලබයි.)

සීමිත වගකීම් සහිත සමාගම් - සංස්ථාගත කිරීමේ සහතිකය

වෙනත් ආයතන - ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය
(තනි පුද්ගල හා හවුල් ව්‍යාපාර)

ආ. කාණ්ඩ ගාස්තු ගෙවන ලද මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල්පිටපත. (ලංකා බැංකුව මගින් නිකුත් කරන ලද)

ඇ. ඔබ ආයතනය 2024 වර්ෂයේ ආරක්ෂක අමාත්‍යාංශයේ සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි වී ඇත්නම් මෙම අමාත්‍යාංශයෙ විසින් නිකුත් කරන ලිපියේ පිටපත.

ඈ. ඔබ ආයතනය VAT සඳහා ලියාපදිංචි වී ඇත්නම් පමණක් වලංගු ලියාපදිංචි සහතිකයේ පිටපත.

**3.2 විදේශීය සැපයුම්කරුවන්**

අ. සහතික කරන ලද ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ/ ලිපියේ පිටපත.

ආ. කාණ්ඩ ගාස්තු ගෙවූ බවට සනාථ වන සහතිකය.

ඇ. 2024 වර්ෂය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි වී ඇත්නම් මෙම අමාත්‍යාංශයෙ විසින් නිකුත් කරන ලිපියේ පිටපත.

**3.3 විදේශය සැපයුම්කරුවන් දේශීය නියෝජිතයන් මගින් ලියාපදිංචි වීමේදී**

අ. විදේශය සැපයුම්කරුගේ සහතික කරන ලද ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ/ ලිපියේ පිටපත.

ආ. විදේශ සැපයුම්කරුවන් ලියාපදිංචිය දේශීය නියෝජිතයන් මගින් සිදු කිරීමේදී ප්‍රධාන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් අත්සන් කරන ලද බලය පවරන ලිපියක මුල් පිටපත ඇමිණිය යුතුය. එහි කාල සීමාවට 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා කාල පරිච්ඡේදය ඇතුළත් විය යුතුය. (ෆැක්ස්, ස්කෑන් හෝ වෙනත් ක්‍රමවේද යටතේ එවනු ලබන ලිපි පිළිගනු නොලැබේ.)

ඇ. කාණ්ඩ ගාස්තු ගෙවූ බවට සනාථ වන සහතිකය.

විදේශීය ගෙවීම් - කාණ්ඩ ගාස්තු ගෙවූ බවට සනාථ වන සහතිකය

දේශීය ගෙවීම් - කාණ්ඩ ගාස්තු ගෙවන ලද මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල්පිටපත

ඈ. දේශීය නියෝජිතගේ සහතික කරන ලද ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත

**ඉ.** 2024 වර්ෂයේ ආරක්ෂක අමාත්‍යාංශයේ සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි වී ඇත්නම් මෙම අමාත්‍යාංශයෙ විසින් නිකුත් කරන ලිපියේ පිටපතක් ඇමිණිය යුතුය.

(ඉහත සඳහන් සියළු ආයතන මෙම උපදෙස් පත්‍රිකාව මගින් ඉල්ලුම් කර ඇති ලේඛණ සහ අදාල පිටපත් පමණක් ඉදිරිපත් කල යුතු අතර වෙනත් ලේඛණ ඇමුණුම් ලෙස ඉදිරිපත් නොකිරීමට ඉල්ලුම්කරුවන් වග බලා ගත යුතුය.)

**4.** විධිමත්ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් අවශ්‍ය සියලු ලිපි ලේඛන **ආවරණ ලිපියක්** සහිතව පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි 2024.11.08 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැල මගින් හෝ ගෙනවිත් ආරක්ෂක අමාත්‍යාංශයේ පිවිසුම් දොරටුවෙහි ලිපි භාරගන්නා නිලධාරියාට භාර දිය යුතුය. (ආරක්ෂක අමාත්‍යාංශයට ගෙනවිත් භාර දෙන අයදුම්පත් සඳහා භාරගත් බවට සහතිකයක් නිකුත් කරනු නොලැබේ).

**ගණකාධිකාරි (සැපයීම්)**
**ආරක්ෂක අමාත්‍යාංශය**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ**

දේශීය සැපයුම්කරුවන්ට අදාළව අයදුම්පත බහාලු ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ **" සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2025 (දේශීය) "** යනුවෙන් සඳහන් කළ යුතු අතර විදේශ සැපයුම්කරුවන් හෝ ඔවුන්ගේ දේශීය නියෝජිතයින් **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2025 (විදේශීය) "** යනුවෙන් සඳහන් කළ යුතුය.

<u>**අයදුම්කරුවන් සඳහා පොදු උපදෙස්**</u>

5. එක් එක් කාණ්ඩය සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 1825/- ක් (රුපියල් එක්දහස් අටසිය විසිපහක) ගාස්තුවක් අය කෙරෙන අතර විදේශ අයදුම්කරුවන්ගෙන් මේ සඳහා අය කෙරෙන ගාස්තුව ඇමරිකානු ඩොලර් 18 ක් වනු ඇත. දේශීය නියෝජිතයින් මගින් ගෙවීම් කිරීමේදි එක් කාණ්ඩයක් වෙනුවෙන් අය කරන ගාස්තුව රු. 5750/= කි.
දේශීය අයදුම්කරුවකු (බොහෝ විට දේශීය නියෝජිතයකු) එක් ප්‍රධාන ආයතනයකට වැඩියෙන් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්කරන්නේ නම් එබඳු එක් එක් ප්‍රධානියා වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කල යුතුය. (මුදල් තැන්පත් කිරීමේදි ගිණුම් හිමියාගේ නම ලෙස

ආරක්ෂක ලේකම් යනුවෙන් සදහන් කර තැන්පතු පත්‍රිකාවේ "Suppliers Registration Category fee – 2025 යනුවෙන් සදහන් කිරීම අනිවාර්ය වේ.)

6. ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ අංක 7040119 දරණ ගිණුමට බැරවන පරිදි ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් කාණ්ඩ ගාස්තු මුදල් ගෙවිය හැකිය. විදේශීය සැපයුම්කරුවන් හට (දේශීය නියෝජිතයන් නොමැතිවිට) කාණ්ඩ ගාස්තු ගෙවීම එක් කාණ්ඩයක් යටතේ ලියාපදිංචි වීම සඳහා ඇමරිකානු ඩොලර් 18 ක් වශයෙන් SWIFT CODE භාවිතයෙන් ඕනෑම රටක ඕනෑම බැංකුවකින් ලංකා බැංකුව වෙත පහත ආකාරයට මුදල් ගෙවිය හැකිය.

| | |
|---|---|
| Swift No | - BCEYLKLX |
| Branch Code | - 747 |
| Account No | - 7040119 |

ස්වයංක්‍රිය මුදල් තැන්පත් කිරීමේදි මුදල් ගෙවීමට හේතුව ලෙස "Suppliers Registration Category fee - 2025" යන්න සටහන් කිරීමට නොහැකි අතර එම තැන්පතු හදුනා ගැනීම දුෂ්කර බැවින් අයදුම්පකරුවන් ස්වයංක්‍රිය මුදල් තැන්පතු මගින් මුදල් තැන්පත් කිරීමෙන් වැලකිය යුතුය.

7. යම් අයදුම්කරුවෙකු විසින් ගෙවන ලද කාණ්ඩ ගාස්තු නැවත ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ. අයදුම්කරුගේ අතපසුවීමකින් හෝ නොසැලකිලිමත්කමින් යම් තොරතුරක් ඉල්ලා ඇති ලේඛනයක් ඉදිරිපත් නොකිරීම, වැරදි කාණ්ඩ ලකුණු කර තිබීම යන හේතුමත අයදුම්පත ප්‍රතික්ෂේප වන අතර එවැනි අවස්ථාවක වුවද කාණ්ඩ ගාස්තු ආපසු ගෙවීමක් සිදු නොවන බව දන්වනු ලැබේ.

8. අයදුම්පතෙහි ප්‍රශ්නයක් ඉදිරියෙහි ඊට උචිත ආකාරයට '' ඔව් / නැත '' යන්න, පැහැර හැරීමකින් තොරව කපා දමන්න.

9. කරුණාකර අයදුම්කරුට අදාළ නොවන කවර හෝ අයිතමයක් ඉදිරියෙන් "අදාළ නොවේ" යන්න සඳහන් කරන්න.

10. ලියාපදිංචි කිරීමෙන් පසුව යම් සමාගමක (දේශීය හෝ විදේශීය) තැපැල් ලිපිනයෙහි යම් සංශෝධනයක් හෝ වෙනසක් සිදු වුවහොත්, එම ඉල්ලීම සළකා බලනු ලබනුයේ එම ඉල්ලීම සමග එකී සංශෝධනයට සම්බන්ධ අදාළ සමාගම (දේශීය හෝ විදේශීය) මගින් නිකුත් කරන ලද සංශෝධිත සහතිකයෙහි සත්‍ය පිටපතක් ඉදිරිපත් කිරීමෙන් පමණි.

11. ලියාපදිංචි කිරීමෙන් පසුව කවර කරුණක් යටතේ හෝ **කාණ්ඩ වර්ගයෙහි** කිසිදු වෙනසක් සිදු කළ නොහැකි බව හා කාණ්ඩ අතර මාරුකිරීම් ද සිදුනොකරන බව සලකන්න.

12. අයදුම්කරුගේ යම් ප්‍රමාදදෝෂයක් හෝ අනවධානය සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය වගකීම භාරගනු නොලැබේ.

13. 2025 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ වැඩිදුර තොරතුරු අවශ්‍ය වුවහොත් පහත සඳහන් නිලධාරීන් අමතන්න.

**ගණකාධිකාරී (සැපයීම්)**

දූරකථන අංක - 011 2430860 දිගුව - 10504
(කාර්යාල වේලාවන් තුළ පමණි)
ඊ-මේල් - modsupplysl@gmail.com

14. රජයේ ප්‍රසම්පාදන උපදෙස් 2006 (භාණ්ඩ සහ වැඩ) මත අංක 8.11.5 ඇ දරණ වගන්තියේ උපදෙස් ප්‍රකාරව කොන්දේසි පැහැර හැරි කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවෙහි නම් සඳහන් සැපයුම්කරුවන්ට ලියාපදිංචි වීම සඳහා අවසර දෙනු නොලැබේ.

15. මිල ගණන් ඉදිරිපත් කළ පසු සැපයීම සඳහා අවශ්‍ය පරිදි තොග තබා ගැනීම සැපයුම්කරු විසින් කළ යුතු අතර, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වන අවස්ථාවේදි එක් මසක ණය පහසුකම් සැපයීමට සියලු සැපයුම්කරුවන් ස්වයංක්‍රීයවම එකඟ වනු ඇතැයි අපේක්ෂා

කෙරේ. එසේ එකග නොවන සැපයුම්කරුවන්, ලියාපදිංචි ලේඛණයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

16. මිල ගණන් කැදවීමේ ක්‍රමවේදය තීරණය කිරීමේ සම්පූර්ණ අයිතිය ආරක්ෂක අමාත්‍යාංශය හෝ ඒ යටතේ ඇති අදාල ආයතනය සතු වන අතර සුදුසු අවස්ථාවලදි ලියාපදිංචි සැපයුම්කරුවන් මගින් සීමිත මිල ගණන් කැදවීම සිදු කරනු ලබයි.

17. ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් සියලු අයදුම්පත් සලකා බලන අතර, අවශ්‍ය සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් ලියාපදිංචි කෙරේ. අවශ්‍ය සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණ කොට නොමැති සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

18. මිල ගණන් ඉල්ලා සිටි අවස්ථාවක වාර හතරක් තුල මිල ගණන් ඉදිරිපත් කිරීමට හා මිල ගණන් ලබා දීමට නොහැකි බව (“No Quote”) දැක්වීමට අපොහොසත් වන හෝ ඇණවුමක් නියමිත වේලාවටම ක්‍රියාත්මක කළ නොහැකි හෝ ඉල්ලා සිටි අවස්ථාවක නියැදි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ සැපයුම් පිරිවිතරයන්ට අනුකූල නොවන හෝ අනුමත නියැදියට වෙනස් සැපයුම් ඉදිරිපත් කරන හෝ සැපයුම්කරුගේ ලියාපදිංචිය දැනුම්දීමකින් තොරව අවලංගු කරනු ඇත.

19. 2025 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.